# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය<br>Date | 2025.01.21<br>පැය 1715 | දුරකථන අංකය<br>Tel.NO | 011-2887973 | මගේ අංකය<br>My NO | D/Media/Out/ 112 /2025 | විද්‍යුත් ලිපිනය<br>E-Mails | dir.media@police.gov.lk |


## පාලර්මේන්තු මන්ත්‍රී වෛද්‍ය අර්චුනා රාමනාදන් මහතා විසින් රථවාහන රාජකාරී නියුතු නිලධාරීන්ගේ රාජකාරියට බාධා කිරීමේ සිද්ධියට අදාල වැඩිදුර වාතර්ාව - අනුරාධපුර පොලිස් ස්ථානය

2025.01.20 වන දින රාත්‍රී කාලයේ අනුරාධපුර පොලිස් වසමේ ගල්වල හන්දිය ප්‍රදේශයේදී, පාලර්මේන්තු මන්ත්‍රී වෛද්‍ය අර්චුනා රාමනාදන් මහතා විසින් රථවාහන රාජකාරී යෙදී සිටි නිලධාරීන්ගේ රාජකාරියට බාධා කරමින් රථවාහන නීතියට අනුකූල නොවී ක්‍රියා කිරීම සම්බන්ධව අනුරාධපුර පොලිසිය විසින් විමශර්නයක් ආරම්භ කර තිබිණි.

සිද්ධිය සම්බන්ධයෙන් අනුරාධපුර පොලිස් ස්ථානය මඟින් අනුරාධපුර ගරු මහේස්ත්‍රාත් අධිකරණය වෙත කරුණු වාතර්ා කරමින් පාලර්මේන්තු මන්ත්‍රී වෛද්‍ය අර්චුනා රාමනාදන් මහතා ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 183, 344 වගන්ති යටතට ගැනෙන හා මෝටර් වාහන පනත යටතට ගැනෙන වැරදි සිදුකර ඇති බවට වැඩිදුරටත් කරුණු වාතර්ා කර ඇත.

ගරු අධිකරණය විසින් පවතින නෛතික ප්‍රතිපාදන යටතේ ඉදිරි විමශර්න කටයුතු සිදුකිරීමටත්, ඒ අනුව සැකකරු අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් වන ඉදිරි ක්‍රියාමාගර් ගැනීමටත්, එම විමශර්නවල ප්‍රගතිය 2025.02.03 වන දින ගරු අධිකරණය වෙත වාතර්ා කිරීමටත් නියෝග කරන ලදී.

අනුරාධපුර පොලිසිය විසින් වැඩිදුර විමශර්න කටයුතු සිදුකරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**